# දැන්වීමයි

**සී.ස මධ්‍යම පළාතේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2022.02.15**

**මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2019 අනුවය.**

## 1. තනතුරු නාමය : සාමාන්‍යාධිකාරී II & I

**වැටුප් පරිමාණ අංක** : S.U.M.L. 01: 01

**වැටුප් පරිමාණය** : 25,400-500X10X600X10-750X10 = 43,900/=

**වයස් සීමාව** : 18- 45

**සුදුසුකම්** : අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් (රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය වාණිජ/ ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**හෝ**

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව

**හෝ**

ඇ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව/ මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව / මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ S.E.M.L 02:01 වැ. ප. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S.E.M.L. 02:03 වැ. ප. සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව/ මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව/ මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධන සහා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව සමග S.E.M.L 02:02 වැ. ප සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S.E.M.L 02:04 වැ. ප. සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

## 2. තනතුරු නාමය : ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක II & I

**වැටුප් පරිමාණ අංක** : S.E.M.L. 02: 06

**වැටුප් පරිමාණය** : 19,100-440X10-540X10-690X10 = 35,800/=

**වයස් සීමාව** : 18- 45

**සුදුසුකම්** : අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක්

**හෝ**

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව

**හෝ**

ඇ. මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය/ බැංකු හා මූල්‍ය කළමනාකරණය/ විගණනය/ ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳව ඩිප්ලෝමා සහතිකය සමග මධ්‍යම කළමනාකරණ iv මට්ටමේ M.M.L.03:09 වැ. ප. පොත් තබන්නා තනතුරේ හෝ M.M.L.03:10 වැ. ප. ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 03ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ M.M.L.03:14 වැ. ප. සහකාර ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ. අ.පො.ස. (උසස් පෙළ) වානිජ්‍ය අංශයෙන් ගණකාධිකරණය ඇතුලුව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 4 කින් / ගණකාධිකරණයට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 03 කින් සමත්වීම සමග M.M.L.03:10 වැ. ප ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ M.M.L 03:14 වැ. ප. සහකාර ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ඉහත වැටුපට අමතරව අනුමත දීමනා හිමිවන අතර, ETF/EPF හා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් හිමිකමද ඔබට හිමි වේ.

අයදුම්පත් ලබාගැනීම සඳහා මුද්දර ගැසූ ලිපි කවරයක් සමග රු. 300.00 ක තැපැල් ඇණවුමක් සී/ස මධ්‍යම පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය නමින් එවීමෙන් හෝ ප්‍රධාන කාර්යාලයට පැමිණ රු. 300.00 ක් ගෙවා ලබාගත හැක.

අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාර්යාලයෙන් ලබාගන්නා ලද අයදුම්පත් මගින් ඉදිරිපත් වන අයදුම්පත් පමණක් භාරගන්නා අතර, අනෙකුත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග සුදුසුකම් සනාථ කරනු ලබන සියලුම සහතිකවල ඡායා පිටපත් සහ පදිංචි සහතිකය සහිතව අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**සී/ස මධ්‍යම පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,**
**107, පේරාදෙණිය පාර, මහනුවර.**

**ගරු සභාපති,**
**සී/ස මධ්‍යම පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,**
**107, පේරාදෙණිය පාර, මහනුවර.**